ඔබේ අංකය / உமது இல / Your No

මගේ අංකය / எனது இல / My No.

දිනය / திகதி / Date 07.07.2022

දුරකථන අංක / தொலைபேசி இல / Telephone Nos 081-2388151

ෆැක්ස් / தொலைநகல் / Fax 081-2389164

විද්‍යුත් තැපැල / ஈ மெயில் / E mail vc@pdn.ac.lk

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**
பேராதனைப் பல்கலைக்கழகம், இலங்கை
**UNIVERSITY OF PERADENIYA**
*Office of the Vice-Chancellor*

**<u>පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සිසුන්ගේ දැන ගැනීම පිණිස</u>**

දයාබර ශිෂ්‍ය ශිෂ්‍යාවනි,

අප පසු කරන මෙම දුෂ්කර කාලයෙහි ඔබගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව සහ ඉක්මණින් කරගෙන යාමටත්, ශිෂ්‍ය සුභසාධන කටයුතු හැකි පමණින් ඉටු කිරීමටත් විශ්වවිද්‍යාල පරිපාලනය සහ පීඨ පරිපාලනය මහත් කැපවීමකින් කටයුතු කරන බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ එක් සිසුවෙක්ගේ අධ්‍යාපන කටයුතු සඳහා වසරකට වැයවන මුදල රු. ලක්ෂ 7½ ක් පමණ වන අතර දැනට අප විශ්වවිද්‍යාලයේ සිසුන් 13,000 ක් පමණ අධ්‍යාපනය ලබයි. එක් දිනකින් හෝ පාඨමාලා කාලය දීර්ඝ වීම ඔබට මෙන්ම විශ්වවිද්‍යාලයට ද අමතර වියදමකි. එම නිසා නිශ්චිත කාල සටහනකට අනුව ඔබගේ පාඨමාලා අවසන් කර, සමාජයට යෑම ඉතාමත් වැදගත් බව අපි දනිමු.

කෝවිඩ් වසංගතය නිසා අතපසු වූ අධ්‍යාපන කටයුතු බොහෝමයක් ඒ ඒ පීඨ සහ දෙපාර්තමේන්තු මගින් ඉතාමත් සාර්ථකව සම්පූර්ණ කර ඇත. ඉන්ධන අර්බුදය සමඟ ඇති වන බාධක ද අවම කිරීමට සෑම විටම අපගේ අවධානය යොමු කර ඇත.

**උදාහරණ ලෙස;**

1. අධ්‍යයන කටයුතු මාර්ගගත ක්‍රමයට අඛණ්ඩව සිදු කිරීමට සමත් ව ඇත.
2. මීට සති දෙකකට පෙර පැවති තත්වය වූයේ ශිෂ්‍ය කණ්ඩායම් 47න් 42 ක්ම විශ්වවිද්‍යාලය තුල ඉතාමත් සාර්ථකව භෞතික අධ්‍යාපන කටයුතු වල නිරතව සිටීමයි. සෙසු කණ්ඩායම් 5ට ද මාර්ගගත අධ්‍යාපනය ලබාදීමට පීඨයන් කටයුතු කර තිබිණි. නේවාසිකාගාරවල ශිෂ්‍ය ශිෂ්‍යාවන් 7600කට පමණ නේවාසික පහසුකම් සපයා දී තිබුණි.
3. ඉතාමත් අසීරුවෙන් වුවද ඔබගේ "ක්ෂේත්‍ර පුහුණුව" අඛණ්ඩව කරගෙන යාමට අවශ්‍ය පියවර ගෙන තිබුණි.
4. ශිෂ්‍ය ශිෂ්‍යාවන් මුහුණ දෙන ආර්ථික දුෂ්කරතාවයන් සැලකිල්ලට ගෙන පීඨාධිපතිවරුන්ගේ මැදිහත් වීම තුලින් ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර විශාල ප්‍රමාණයක් මෑත කාලයේදී ලබා දී ඇත.

5. ආපන ශාලාවල ප්‍රතිසංස්කරණ සහ බඩුබාහිරාදිය සපයා දීම දැනටමත් සාර්ථකව නිම කරමින් තිබේ.
6. නේවාසිකාගාර වල ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට පියවර ගෙන ඇත. අරුණාචලම් හා ජේම්ස් පීරිස් ශාලාවල පහත මාලයන් වෙත සිසුන් අනුයුක්ත කිරීමට මේ වන විට හැකියාව පවතී. විජේවර්ධන ශාලාවෙහි එක් කොටසක් (වින්ග් එකක්) ප්‍රතිසංස්කරණය කොට අවසන් කර ඇති අතර අනෙක් කොටසෙහි අලුත්වැඩියා කටයුතු කෙරෙමින් පවතී.
7. දැනටමත් කර ඇති පරිදි, අධ්‍යාපන කටයුතු ඉදිරියට කරගෙනයාම, විභාග පැවැත්වීම, ප්‍රායෝගික පුහුණුවීම් වැනි කාරණා ගැන තීරණ ගැනීම, එක් එක් පීඨවල නිර්දේශ මත ක්‍රියාත්මක කරන බව ද දන්වමි.

ඔබගේ පාඨමාලා , අධ්‍යාපන කටයුතු ගැන යම් කරුණක් දැන ගැනීමට අවශ්‍ය නම් ඔබගේ පීඨාධිපතිතුමන්ගේ/ තුමියන්ගෙන් කරුණු විමසීමට සෑම ශිෂ්‍යයෙකුටම අවස්ථාව සලසා දී ඇති බව ද මතක් කර සිටිමි. මෙම දුෂ්කර කාලයෙහිදී ඔබගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට අධ්‍යයන හා අනධ්‍යයන කාර්‍ය මණ්ඩලයෙහි කැපවීම ද ඔබ හා අප අගය කල යුතුය.

මෙම දුෂ්කර කාලය ඉතාම ඉක්මණින් අවසන් වේවා යැයි ප්‍රාර්ථනා කරමි.

උප කුලපති
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය
ශ්‍රී ලංකාව

උපකුලපති.
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

*(මෙහි අඩංගු කරුණු හෝ වෙනත් කරුණු සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කරගැනීමට හෝ දැනගැනීමට අවශ්‍ය නම් ඕනෑම ශිෂ්‍යයකුට හෝ ශිෂ්‍ය නියෝජිතයින්ට උපකුලපති කාර්යාලය හා සම්බන්ධ විය හැක.*
*ඔබගේ නම/ පීඨය හා දුරකථන අංකය සමඟ පහත සදහන් විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ පැමිණිලි බිහිදොරට ඔබගේ ගැටළුව යොමුකිරීමට අවස්ථාව සලසා ඇත. ඔබගේ ගැටළු හෝ අනන්‍යතාවය සම්බන්ධයෙන් රහස්‍යභාවය අප ආරක්ෂා කරමු.*
vcoffice@gs.pdn.ac.lk
https://www.pdn.ac.lk/complaints.php
*ඔබට මා හමුවීමට අවශ්‍ය නම් පහත දුරකථන අංකයට ඒ පිළිබදව දැනුම් දෙන්න.*
***081-2392080)***